**අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**

වෙත යොමු කරන ලද

**ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත**

සම්බන්ධයෙන්

**අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව**

පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ

**අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා, පා.ම. විසිනි**

**2025 ඔක්තෝබර් මස 07 වැනි අඟහරුවාදා**

-----------------------------------------------------------------------------

**கல்வி, ஊழியப் படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவிற்கு ஆற்றுப்படுத்தப்பட்ட**

விளையாட்டில் ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயம் (திருத்தச்) சட்டமூலம் மீதான

**கல்வி, ஊழியப் படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் அறிக்கை**

கல்வி, ஊழியப் படை மற்றும் மனித மூலதனம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்

**கௌரவ ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி, பா.உ. அவர்களால்**

பாராளுமன்றத்தில் சமர்ப்பிக்கப்பட்டது

2025 ஒக்டோபர் மாதம் 07 ஆம் திகதி செவ்வாய்க்கிழமை.

-----------------------------------------------------------------------------

**Report of the**

**Sectoral Oversight Committee on Education, Manpower and Human Capital**

**on**

**Convention against Doping in Sport (Amendment) Bill**

**referred to**

**Sectoral Oversight Committee on Education, Manpower and Human Capital**

**Presented to Parliament by**

**Hon. Hesha Withanage Ankumbura Arachchi, M.P.**

**Chair of the**

**Sectoral Oversight Committee on Education, Manpower and Human Capital**

**Tuesday, 07 October 2025**

<u>කාරක සභාවේ වාර්තාව</u>

2025 සැප්තැම්බර් මස 30 වැනි දින පාර්ලිමේන්තුවේදී රැස් වූ අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් පනත් කෙටුම්පත සලකා බලන ලදී.

- **ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත**
  (2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍යය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි)
  (2025 සැප්තැම්බර් මස 12 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලදුව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**<u>සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්</u>**
ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම. (තාවකාලික සභාපති)
ගරු නිතීෂා නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය, පා.ම.
ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා, පා.ම.

**<u>කාරක සභාවේ ලේකම්</u>**
එස්.ඩබ්.ටී.ආර් ද සිල්වා මහත්මිය, ප්‍රධාන නිලධාරී, ආංශික අධීක්ෂණ කාරක සභා කාර්යාංශය

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

**<u>තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය</u>**
ජ්.එච්.එම්.යූ.අරුණ බණ්ඩාර මහතා, ලේකම්

**<u>සංවර්ධන අංශය</u>**
එම්.පී.එන්.එම්. වික්‍රමසිංහ මහතා, අතිරේක ලේකම්

**<u>ප්‍රතිපත්ති සහ ව්‍යවස්ථාපිත කටයුතු අංශය</u>**
එම්.ඩබ්.ජේ. කුමාර මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ආර්.ඒ.ඩී.එස්.ආර්. රණවක මහත්මිය, නීති නිලධාරී

**<u>ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව</u>**
වී. ප්‍රේමචන්දිරන් මහතා, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්
අයි.පී. විජේරත්න මහතා, අධ්‍යක්ෂ (ක්‍රීඩා)

**<u>ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය</u>**
ආචාර්ය දූෂාන් ලලීෂ කහටපිටිය මහතා, සභාපති
ඩී.එන්.ඒ.එස්. මල්ලවආරච්චි මහත්මිය, නීති නිලධාරී
එස්.එස්.පී. දර්ශන ගාල්ලගේ මහතා, අධ්‍යක්ෂ
කේ.ආර්. කනගසභාපති මහතා, භාෂා පරිවර්තක

**<u>ජාතික ක්‍රීඩා විද්‍යා ආයතනය</u>**
ඩබ්ලිව්.කේ.ආර්. කුමාර මහතා, සහකාර කථිකාචාර්ය

**<u>නීතිපති දෙපාර්තමේන්තුව</u>**
මනෝහර ජයසිංහ මහතා, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්

**<u>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>**
එස්.එස්.එම්.ඩී.ඊ. වීරකෝන් මහත්මිය, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක
ජී.කේ. හේවාවිතාරණ මහතා, සහකාර නීති කෙටුම්පත් සම්පාදක

**<u>හැඳින්වීම</u>**

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යනු, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි ජාත්‍යන්තර සම්මුතිය බලාත්මක කිරීම පිණිස ද, උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මඟින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඉහත කී සම්මුති රාමුව තුළ ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිවීම සඳහා අදාළ දේශීය නීතිමය යාන්ත්‍රණයක් නිශ්චිතවම සඳහන් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත හඳුන්වාදීමේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවට පිරිසිදු සහ සාධාරණ ක්‍රීඩාවක් තහවුරු කිරීමයි.

ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවලට සම්බන්ධ තහනම් උත්තේජක භාවිතය පිළිබඳ නීති සහ රෙගුලාසි වාර්ෂිකව අධීක්ෂණය කරන අතර, ඒ අනුව නූතන ක්‍රීඩා අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි ලෝක උත්තේජක මර්දන

නියෝජ්‍යායතනයේ (World Anti-Doping Agency- WADA) නීති සහ රෙගුලාසිවලට අනුව පවතින පනත සංශෝධන කිරීමට අපේක්ෂා කර ඇත.

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම් වත්මන් ක්‍රීඩා අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම අත්‍යාවශ්‍ය බව ලෝක උත්තේජක මර්දන නියෝජිතායතනය විසින් අවධාරණය කර ඇත.

<u>**කාරක සභා නිරීක්ෂණ**</u>

- 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 2 වැනි වගන්තිය සංශෝධනය කිරීමේදී "ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර" යන වචන වෙනුවට, නව පනත සඳහා "ශ්‍රී ලංකාව තුළ" යන වචන ආදේශ කිරීම මඟින් තහනම් උත්තේජක ගැනීම සම්බන්ධයෙන් වූ වැරදිවලින් බැහැරවීමට ක්‍රීඩකයෙකුට හැකියාවක් නොලැබෙන බවත් එම වැරදි සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා ප්‍රතිපාදන පනතේ 24 වැනි වගන්තිය මඟින් දක්වා ඇති බව.

- ප්‍රධාන ප්‍රඥප්තියේ සංශෝධිත 5 වැනි වගන්තිය තුළ චිකිත්සක භාවිතය පිළිබඳ මුක්තිය සඳහා පැහැදිලි ප්‍රතිපාදන ඇති බවත් රෝගාබාධ වෙනුවෙන් අදාළ ඖෂධ භාවිතය සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ අනුමතිය ලබාගත යුතු බව.

- ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වැනි වගන්තියේ ඇතුළත් "පරිපාලනය කිරීමේ" යන වචන වෙනුවට "අධීක්ෂණය කිරීමේ" යන වචන ආදේශ කොට සංශෝධනය කිරීම මඟින් අපේක්ෂා කරන ලද්දේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ කටයුතු කිසිවෙකුට මැදිහත් නොවන ආකාරයෙන් ස්වාධීනව සිදුකිරීමට කටයුතු සැලසීම බව.

<u>**කාරක සභාවේ තීරණ**</u>

සලකා බැලීමෙන් අනතුරුව, කාරක සභාව ඉහත සඳහන් පනත් කෙටුම්පතට එකඟ වූ අතර, ඒ පිළිබඳව සකසන ලද කාරක සභාවේ මෙම වාර්තාව, කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා විසින් 2025 ඔක්තෝබර් මස 07 වැනි අඟහරුවාදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි තීරණය කරන ලදී.